# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2352/05 - 2023 ඔක්තෝබර් මස 03 වැනි අඟහරුවාදා - 2023.10.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KDS/UDB/4/1/2/8.

මප/තෙල්දෙණිය/මැදිවක විද්‍යාලය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදිවක ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි තනහම්පිටියේ කුඹුර, තනහම්පිටියේ හේන නම් වූ සර්වේ ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 321339 කලාප අංක 01, පත්‍ර අංක 01 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 01 වන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1745ක් වූ ඉඩම.

හිමිකම් කියන අය:- 01. ඉසුප් ඉස්මයිල් අබ්දුල් රසාක් මයා, 2A, මැදිවක, උඩදුම්බර.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.12.18 වැනි දින පෙ.ව. 10.00ට උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023.12.11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**නිලූෂා මනෝරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0002


1A - G 040418 - 19 (2023/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*